කාර්ය සාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

Performance Report

2019

සංස්කෘතික කටයුතු අංශය

கலாசார அலுவல்கள் பிரிவு

Cultural Affairs Division

නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

வீடமைப்பு, நிர்மாணத்துறை மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு

Ministry of Housing, Construction and Cultural Affairs

2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

(සංස්කෘතික කටයුතු අංශය)

වැය ශීර්ෂ අංකය - 123

අන්තර්ගතය

	පිටු අංකය
පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	02 - 09
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	10 - 16
පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	17 - 28
පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක	29
පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු(SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	30
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ	31
පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව	32 - 43

පරිච්ඡේදය 01- ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලාංකික පෞඪ උරුමයන් සංරක්ෂණය කිරීමේ හා ආරක්ෂා කිරීමේ පූර්ණ වගකීම දරමින්, සාහිත්‍ය හා කලාව පෝෂණය කරමින්, අනන්‍ය ශ්‍රී ලාංකික ජාතියක් බිහිකිරීමේ උදාර කර්තව්‍ය ඉටු කිරීමට සංස්කෘතික අමාත්‍යාංශය බැඳී සිටියි. මේ සඳහා රට හැඳීමේ සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්තියට අනුකූලව, තිරසර සංවර්ධන වැඩසටහන පාදක කරගනිමින් යහගුණයෙන් පිරිපුන් වූ සංවේදී මිනිසුන්ගෙන් සපිරුණු තිරසර සංවර්ධිත ශ්‍රී ලංකාවක් වෙත පිය නැගීමට අවැසි හුදු මහත් කාර්යභාරය ඉටු කරමින් සිටී.

1.2 දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

තිරසාර ලෙස සංවර්ධිත ශ්‍රී ලංකාවක්

මෙහෙවර

සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක උරුමයන් ස්ථානීය හා අස්ථානීය සංරක්ෂණය, චිත්‍රපට, නාට්‍ය හා රංග කලාවන්, ස්පෘෂ්‍ය - අස්පෘෂ්‍ය උරුමය හා රාජ්‍ය ලේඛණ සංරක්ෂණය කිරීම සහ ශ්‍රී ලාංකීය සංස්කෘතිකාංග සංරක්ෂණය, ප්‍රවර්ධනය හා ප්‍රචාරණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම.

අරමුණු

ශ්‍රී ලාංකික සංස්කෘතිය, රටේ ජනතාව සුඛිත මුදිත කිරීම සඳහා හඳුන්වා දෙනු ලබන සියලු වැඩසටහන් සඵල කර ගැනීම සඳහා ඉවහල් වන, ජනතා හැසිරීම මෙහෙය වන ප්‍රධාන මෙවලම ලෙස සලකා අරමුණු හඳුනාගෙන ඇත.

- රටේ පොදු ජාතික සංවර්ධන ප්‍රතිපත්තිය සාර්ථක කර ගැනීමට දායකවන ආකාරයෙන් ජනතාව ස්වයංව මෙහෙයවන සාධනීය සංස්කෘතික පරිසරයක් රට තුළ ගොඩනැගීම.
- ශ්‍රී ලාංකික බහු ජාතිකත්වය පිළිගනිමින්, ඒ එක් එක් උප සංස්කෘතිවල අනන්‍යතාව ආරක්ෂා කරන අතරම සියලු උප සංස්කෘති එක්වගෙන ශ්‍රී ලාංකික වූ මහා සංස්කෘතියක් සහිත රටක් ලෙස ඉදිරියට පවත්වාගෙන යාම සහ විවිධ බලවේග හරහා හානියට පත්වන සාධනීය සංස්කෘතිකාංග, එවැනි හානිවලින් වළක්වා ගැනීම.
- සංස්කෘතික පරිහානියට හේතුවන බාහිර හා අභ්‍යන්තර සාධක හඳුනාගැනීමේ හා ඒවා නිශේධනය කිරීමේ ස්වයං ශක්තිය ජනතාවට ලබාදීම.
- සංස්කෘතික උරුමයන් සංරක්ෂණය, පවත්වාගෙන යාම සහ ප්‍රයෝජනයට ගැනීම මගින් ලාංකික ජනතාවගේ ජීවන චර්යාවේ සංස්කෘතිකමය හැඩ ගැස්ම සකස් කර ගැනීමට මං සැලසීම.
- සාධනීය සංස්කෘතිකාංග හඳුනාගැනීමට හා ඒවා තම ජීවන දර්ශනයට යාකර ගැනීමට ජනතාව පෙළඹවීම හා ඒ මගින් ශ්‍රී ලාංකික අනන්‍යතාව ඇති සංස්කෘතියක් ගොඩ නැගීම.
- ගෝලීය හා අනාගත අභියෝග ජය ගැනීම සඳහා දේශාභිමානී චින්තනය පෙරටුකරගත්, නිර්මාණශීලී, කුසලතාවයෙන් පරිපූර්ණ , සාමූහික, ස්වයං අභිප්‍රේරිත පරපුරක් බිහි කිරීමට හා පවත්වාගෙන යාමට සමාජය බල ගැන්වීම.

1.4 සංස්කෘතික කටයුතු අංශය - සංවිධාන සැලැස්ම 2019



1.5 අමාත්‍යාංශයේ සංස්කෘතික කටයුතු අංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

i. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලාංකික ජනතාව ආධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය වූ සංවේදී මිනිසුන් බවට පත් කිරීමේ ඒකායන අපේක්ෂාව සපුරා ගැනීම වස්, ශ්‍රී ලංකික සංස්කෘතිය ගොඩනැගීමේ අරමුණින් යුතුව, ශ්‍රී ලාංකික අනන්‍යතාවයෙන් යුත් සාහිත්‍ය කලා හා සංස්කෘතික කටයුතු සංරක්ෂණය, ප්‍රවර්ධනය,ව්‍යාප්තිකරණය සඳහා වූ වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

- සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ආයතන
  - ජාතික කලා භවන හා ජෝන් ද සිල්වා සමරු රඟහල
  - නිදහස් මන්දිරය
  - මහාවංස සම්පාදන කාර්යාලය
  - ශබ්දකෝෂ කාර්යාලය
  - විශ්වකෝෂ කාර්යාලය
  - ජන සංගීත සංරක්ෂණ ඒකකය
  - එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය පුහුණු පාසල
  - වලිසිංහ හරිස්චන්ද්‍ර කෞතුකාගාරය හා සංස්කෘතික කේන්ද්‍රය
  - ජාතික කලා නිකේතනය මහනුවර කුණ්ඩසාලේ -
  - උතුරු දකුණු මිතුරු සෙවණ - මිහින්තලේ
  - පොත් ගබඩාව හා පොත් අලෙවිසැල
  - රාජ්‍ය නැටුම් කණ්ඩායම හා රාජ්‍ය සංගීත කණ්ඩායම
- සංස්කෘතික, කලා හා සාහිත්‍ය කටයුතු ප්‍රවර්ධනය උදෙසා රාජ්‍ය උත්සව/උළෙල සංවිධානය කිරීම
- කලාකරු සුභ සාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- සංස්කෘතික, කලා හා සාහිත්‍ය කටයුතු ප්‍රවර්ධනය උදෙසා විශේෂ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ii. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

1877 වර්ෂයේ ස්ථාපනය කරන ලද මෙම දෙපාර්තමේන්තුව සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා ජාතික උරුමය සංරක්ෂණය, ප්‍රදර්ශනය හා ප්‍රචාරණය කිරීම සංස්කෘතික හා ස්වාභාවික උරුමයට අයත් සම්පත් විද්‍යාත්මකව හා ක්‍රමාණුකූලව ආරක්ෂා කිරීම හා මහජනතාවගේ ඇගයීම අධ්‍යාපනය හා රසාස්වාදය උදෙසා ඉදිරිපත් කිරීම ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මගින් සිදු කරයි.

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධනා අංශ

- දිවයින පුරා පිහිටුවා ඇති ජාතික කෞතුකාගාර (10කි)
- මානව විද්‍යා අංශය
- මානව වංශ විද්‍යා අංශය
- භූ විද්‍යා අංශය
- සත්ත්ව විද්‍යා අංශය

- කීට විද්‍යා අංශය
- උද්භිද විද්‍යා අංශය
- සංරක්ෂණ අංශය
- පුස්තකාලය
- අධ්‍යාපන හා ප්‍රකාශන අංශය

iii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

සමස්ත පුරාවිද්‍යාත්මක උරුමය මනාලෙස කළමනාකරණය කර මතු පරපුරට දායාද කිරීම උදෙසා,ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණයේ වගකීම දරන උපරිම ආයතනය සහ එහි ප්‍රධාන නියාමන ආයතනය ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කටයුතු කරයි. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය හඳුනා ගැනීම, ශ්‍රී ලංකාවේ චංචල හා නිශ්චල පුරාවිද්‍යාත්මක උරුමය ලේඛනගත කිරීම, පුරාවිද්‍යාත්මක උරුමය විනයානුකූලව සංරක්ෂණය කිරීම, නඩත්තු කර පවත්වාගෙන යාම හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, පුරාවිද්‍යා ආඥා පනත ක්‍රියාත්මක කිරීම, සංස්කෘතික දේපල පනත ක්‍රියාත්මක කිරීම, පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක මහජනයා වෙත ඉදිරිපත් කිරීම හා විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී පුරාවිද්‍යාත්මක වටිනාකම්න් යුතු ස්ථානවලට සිදුවන හානිය පිළිබඳ හානි ඇගයුම් සමීක්ෂණ කටයුතු කිරීම මෙම ආයතනයේ ප්‍රධාන කාර්යයන් වේ.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධනා අංශ

- ගවේෂණ හා ලේඛනගත කිරීමේ අංශය
- කැණීම් අංශය
- කෞතුකාගාර අංශය
- වාස්තු විද්‍යා සංරක්ෂණ අංශය
- රසායන සංරක්ෂණ අංශය
- අභිලේඛන හා නාණක විද්‍යා අංශය
- නඩත්තු අංශය
- ප්‍රවර්ධන අංශය

iv. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

සංස්කෘතික දායාදයේ කොටසක් ලෙස රාජ්‍ය ලේඛන විධිමත් කළමනාකරණය සහ සංරක්ෂණය උදෙසා ජාතික ලේඛනාරක්ෂක නීතිය සහ ඊට අදාළ නීති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, ස්ථිර සංරක්ෂණය සඳහා රාජ්‍ය ලේඛන සහ අද්විතීය පෞද්ගලික ලේඛන ආබද්ධ කර ගැනීම, අදාළ නීති රීතිවලට අනුකූලව සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන රාජ්‍ය ලේඛන කළමනාකරණය සහ සංරක්ෂණය, අදාළ නීතිමය තැන්පතුවට පුවත්පත් සහ ප්‍රකාශන උපචිත කරගැනීම, රාජ්‍ය පරිපාලන ක්‍රියාවලියේ දී සහ මහජන පර්යේෂණසඳහා තැන්පතු ලේඛනවලින් තොරතුරු සමුද්ධරණය කිරීමට පහසුකම් සැලසීම ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව මගින් ඉටු කරයි.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධනා අංශ

- රාජ්‍ය ලේඛන ආබද්ධ කර ගැනීම
- ප්‍රදර්ශන
- පොත් සහ පුවත්පත් ලියාපදිංචිය
- ලේඛන සංරක්ෂණය
- පුවත්පත් සූක්ෂම ඡායාගත කිරීම
- ලේඛනාගාර ගොඩනැගිල්ල පුළුල් කිරීම
- ලේඛන කළමනාකරණ ව්‍යාපෘතිය
- පර්යේෂණ අංශය
- මහජන සම්බන්ධතා අංශය

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන/අරමුදල්

i. මධ්‍යම සංස්කෘතික අරමුදල

ශ්‍රී ලාංකේය උරුමය ජගත් ආශ්චර්යය බවට පත් කිරීම උදෙසා, ජාතික මෙන්ම අන්තර්ජාතික වශයෙන්ද වැදගත් වන ලෝක උරුම ප්‍රදේශවල ඇති ස්මාරක පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවසරය හා අධීක්ෂණය මත කැණීම් කර සංරක්ෂණය කිරීමත්, එම පුරාවිද්‍යා භූමි ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමත් අරමුණු කරගෙන පිහිටුවා ඇත. ඒ සඳහා අරමුදල් රැස්කර ගැනීමට 1980 අංක 57 දරණ පාර්ලිමේන්තු පනත මඟින් මධ්‍යම සංස්කෘතික අරමුදලට බලය ලබා දී ඇත.

ii. ටවර් හෝල් රඟහල පදනම

ශ්‍රීලංකාවේ ජාතික නාට්‍ය මධස්ථානය බවට පත්වෙමින් ගුණාත්මක නාට්‍ය හා රංග කලා සංස්කෘතියක් බිහි කිරීමෙහි ලා පුරෝගාමී ආයතනය බවට පත්වීමෙන් අරමුණින් යුතුව, ශ්‍රී ලංකාව තුළ ගුණාත්මක නාට්‍ය හා රංග කලා සංස්කෘතියක් බිහි කිරීමට සහ ප්‍රවර්ධනයට දායකවෙමින් සිටී. ඒ සඳහා අවශ්‍ය දැනුම, යටිතල පහසුකම් සපයමින් නූතන විශ්ව නාට්‍ය හා රංග කලා භාවිතයේ නව අත්දැකීම් තාක්ෂණය සහ ඥානය නොඅඩුව ලබා ගැනීමට අවශ්‍ය නව මංපෙත් සකසා දෙමින් හා නාට්‍ය හා රංග කලා නිර්මාණවේදීන් දිරිගන්වමින්, රටේ සංවර්ධනයට මෙන්ම මානව වර්ගයාගේ යහපත සඳහා නිර්මාණකරණයේ යෙදීමට ඔවුන් පෙළඹවීම ටවර්හෝල් රහල පදනමින් සිදු කරනු ලබයි.

iii. ජන කලා කේන්ද්‍රය

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික හා පාරම්පරික අස්පෘෂ්‍ය උරුමයන් හඳුනා ගැනීම හා සංරක්ෂණය, එම උරුමයන් මතු පරපුර වෙත දායාද කිරීමට අවශ්‍ය නිර්මාණශීලී පියවරගැනීම, අස්පර්ශනීය උරුමයන් පිළිබඳ නිර්මාණශීලී වෘත්තිකයන් බිහිකිරීමට අවශ්‍ය දැනුම හා ඊට අදාළ පරිසරය ගොඩ නැඟීම, අස්පර්ශනීය උරුමයන්හි මූලයන් ශක්තිමත් කිරීම හා ඒවායේ නියැලි ශිල්පීන්ට අභිමානයක් ලබා දීම,ශ්‍රී ලාංකේය අස්පෘෂ්‍ය උරුමයන් පිළිබඳව ලොව දැනුවත් කිරීම මෙහි ප්‍රධාන කාර්යයන් වේ.පෙරදිග සංගීතය,ගායනය, වාදනය හා ජනසංගීතය, නර්තනය උඩරට), පහතරට හා සබරගමු (චිත්‍ර හා මූර්ති) යනා දී පූර්ණ කාලීන සෞන්දර්ය පාඨමාලා දැනට ජනකලා කේන්ද්‍රය මඟින් පැවැත් වේ.

iv. ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය

ලාංකීය සමාජයට බලපාන ප්‍රසිද්ධ රඟ දැක්වීම් සම්බන්ධයෙන් දේශීය චිත්‍රපට, නාට්‍ය සහ සියළුම මහජන සංදර්ශන යන විෂය පථයන් දක්වා ඇත. එහිදී උක්ත විෂය පථයන් ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩල පනත යටතේ මහජන ප්‍රදර්ශනය සඳහා සුදුසු ද යන්න දැක්ම අනුව විමර්ශනය කර ඇත.ඒ අනුව ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය මඟින් සුදුසු පරිදි හා අවශ්‍ය අවස්ථාවල දී පරීක්ෂා කර බලා වර්ගීකරණයට ලක් කිරීම, වත්මන් ප්‍රධාන කාර්යයන් ලෙස දක්වනු ලැබේ.

v. **ශ්‍රී ලංකා කලා මණ්ඩලය**

කලා කටයුතු ප්‍රවර්ධනය, සංරක්ෂණය හා සංවර්ධනය සඳහා අවශ්‍ය අනුමණ්ඩල පත්කොට ඒවාට නායකත්වය සැපයීම හා මඟ පෙන්වීම, සාහිත්‍ය, නාට්‍ය, සංගීත, නර්තන හා චිත්‍ර අනුමණ්ඩල මඟින් දීප ව්‍යාප්තව කටයුතු සංවිධානය කිරීම, ජාතික මට්ටමේ ඇගයීම්වලට ශිල්පීන් ගෙන ඒම හා ඔවුන් ජාතික තලයට හඳුන්වාදීම මඟින් නියමිත ක්ෂේත්‍රයන් තුළ ඉහළම තලයන් හි පිහිටුවීම,ලලිත කලාවන්හි තත්වය වැඩි දියුණු කිරීම, ශ්‍රී ලංකාවට ආවේණික කලා ශිල්ප කර්මාන්ත නගා සිටුවීම, කලා කටයුතු සඳහා සම්බන්ධිත වෙනත් දෙපාර්තමේන්තු, ආයතන, ස්වෙච්ඡා සංවිධාන සමග සම්බන්ධ වී කටයුතු කිරීම, සාරධර්ම වලින් පිරි සමාජයක් බිහි කිරීම සඳහා සුදුසු සංස්කෘතික පරිසරයක් ගොඩනැගීම මෙහි ප්‍රධාන කාර්යයන් වේ.

vi. **අපේ ගම**

ශ්‍රී ලාංකේය ජන ජීවිතයේ ප්‍රධාන අංගයක් වන ගමේ සංස්කෘතිය, කලාව, දේශීය සම්ප්‍රධාය හා එහි විවිධත්වය උරුම දෘෂ්ඨියෙන් විදහා දැක්වීමත්, දෙස් විදෙස් සංචාරකයින්ට සහ පාසල් සිසුන්ට ශ්‍රී ලාංකේය ගමෙ හි, බහු සංස්කෘතික විවිධත්වය නිර්මාණශීලී අත්දැකීමක් ලෙස ඉදිරිපත් කිරීම සහ එමගින් ගම පිළිබඳ සංස්කෘතික දැනුම ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණයි. වර්තමානය වනවිට ගම සහ ගැමි ජන ජීවිතය විපර්යාසයන්ට ලක් වීමත් සමග විතැන්වන ගැමිකම එහි ගතිකත්වයන් ඊට ආවේනික සෙසු අංගෝපාංග සීඝ්‍රයෙන් අවපාතයට යමින් පවතින අතර, ඒ සඳහා පිළියමක් වශයෙන් බත්තරමුල්ල, අපේගම පරිශ්‍රය 2013.11.13 වන දින ගම්මානයක ආකෘතියක් වශයෙන් ආරම්භ කරන ලදී. ඒ සඳහා බත්තරමුල්ල අපේගම පරිශ්‍රය අස්පෘෂ්‍ය උරුමයේ සංරක්ෂිත මධ්‍යස්ථානයක් වශයෙන් ප්‍රතිනිර්මාණය කිරීමටත්, සංචාරක ප්‍රවර්ධන කාර්යය ඵලදායී මෙහෙවර මධ්‍යස්ථානයක් වශයෙන් සැකසීමට මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතී.

vii. **ශ්‍රී ලංකා ජාතික චිත්‍රපටි සංස්ථාව**

1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන පනත මඟින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව මෙරට සිනමා කර්මාන්තයේ පරිපාලනය සහ නියාමනය සඳහා ඇති එකම රාජ්‍ය ආයතනය වේ. නව තාක්ෂණික ක්‍රමවේදයන් අනුගමනය කරමින් තෘප්තිමත්, වගකීම් හඳුනාගත්, සුහදශීලි සේවාවක් ගනුදෙනුකරුවන්ට ලබා දෙමින්, නිර්මාණකරණයට අවශ්‍ය අධ්‍යාපනය , අනුබලය හා සුභසාධනය ලබා දෙමින් ගුණාත්මක සිනමා සංස්කෘතියක් බිහි කිරීම උදෙසා මෙම ආයතනය කටයුතු කරයි. 1999-06-17 දිනැතිව එවකට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්, ඩික්සන් නිලවීර මහතා විසින් නිකුත් කරන ලද ජාතික චිත්‍රපට ප්‍රතිපත්තිය හා ඒ පිළිබඳ මාර්ගෝපදේශය මඟින් චිත්‍රපට බෙදා හැරීම මණ්ඩල 05 ක් යටතේ ක්‍රියාත්මක වේ. 2018.12.31 දිනට දිවයින පුරා සිනමා ශාලා 188ක් ක්‍රියාත්මකව පවතී.

viii. **ගාලු උරුමය පදනම**

ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම සංස්කෘතික සංචාරක පුරවරය ජීවමාන ලෝක උරුම ගාලු කොටුවයි. ඓතිහාසික සංස්කෘතික මධ්‍යස්ථානයක් සහ පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති ප්‍රදේශයක් ලෙස ගාලු කොටුව සංරක්ෂණය කිරීම හා විශිෂ්ඨතම සංචාරක පුරවරයක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ

අරමුණින් 1994 අංක 07 දරණ පාර්ලිමේන්තු පනත මගින් පිහිටවනු ලැබූ ගාලු උරුමය පදනම ව්‍යවස්ථාපිත ආයතනයකි.කොටු පවුර හා ගොඩනැගිලි සංරක්ෂණය, ගාලු කොටුවේ ජාතීන් අතර අන්‍යෝන්‍ය සහයෝගය හා සම්බන්ධීකරණය ඇති කිරීම, ඓතිහාසිකත්වය ආරක්ෂා කිරීම පිළිබඳ දැනුවත් කිරීම, ආකල්ප වර්ධනය, භෞතික සංවර්ධනය, සංචාරක පහසුකම ඇති කිරීම හා වැඩිදියුණු කිරීම, සංචාරක ආකර්ශනීය ස්ථාන ඇති කිරීම හා සංවර්ධනය කිරීම, ආගන්තුක සත්කාර වර්ධනය කිරීම, ගාලු කොටුව නිවැසියන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම, ගාලු කොටුවේ ජාතීන් අතර සමානාත්මතාවය වැඩිදියුණු කිරීම, පාරම්පරික ජීවනෝපායන් නංවාලීම, සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ ක්‍රියාකාරකම් විධිමත් කිරීම, පාරිභෝගික අගයන් වැඩි කිරීම, කාර්යක්ෂම සේවාවක් ලබාදීම යනාදිය මෙහි කාර්යයන් වේ.

ix. **රන්මිහිතැන්න ජාතික ටෙලි සිනමා උද්‍යානය**

කලාවෙන් පොෂිත ජන සමාජයක් බිහි කිරීමේ දැක්මෙන් යුතුව රූපවාහිනී හෝ වෙනත් මාධ්‍යය මගින් විකාශනය කරන ශ්‍රී ලාංකික කලාව, සංස්කෘතිය, නාට්‍ය, සිනමාව, ටෙලි නිර්මාණ හා වානිජ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම, දේශීය හා විදේශීය කලාකරුවන්ට, නිෂ්පාදකයින්ට සිනමාව, නාට්‍ය, ටෙලි නිර්මාණ හා වානිජ වැඩසටහන් සඳහා පසුතල නිර්මාණය කිරීම, සැපයීම හා ප්‍රවර්ධනය කිරීම, දේශීය හා විදේශීය කලාකරුවන්ට සංස්කෘතිය, කලාව, සිනමාව, නාට්‍ය, ටෙලි නිර්මාණ හා වානිජ වැඩසටහන් නිෂ්පාදනයට අවශ්‍ය අනෙකුත් පහසුකම් සැපයීම, මෙම ටෙලි සිනමා උද්‍යානය සතු සම්පත් අධ්‍යාපනික පුහුණු වැඩසටහන්, පර්යේෂණ, ගවේෂණ කටයුතු විශේෂඥ දැනුම හා තාක්ෂණික දැනුම හුවමාරු වැඩමුළු ආදියට ලබාදීම හා ඉහත සඳහන් මූලික පරමාර්ථයන්ට බාධා නොවන පරිදි නරඹන්නන්ට, සංචාරකයින්ට ආකර්ෂණීය මධ්‍යස්ථානයක් ලෙස හා ආදායම් ප්‍රවර්ධනය සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම ආයතනයෙන් සිදු කරනු ලබයි.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (නැත)

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

2.1 ප්‍රධාන වැඩසටහන් හා ව්‍යාපෘති ප්‍රගතිය 2019

I. සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම

i. සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම - මූල්‍ය ප්‍රගතිය 2019.12.31 දිනට

වැය විෂය විස්තරය	2019 ප්‍රතිපාදන රු.මි.	වියදම 2019.12.31 දිනට රු.මි.	මූල්‍ය ප්‍රගතිය
සංස්කෘතික මධ්‍යස්ථානවල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 123-02-05-9-1409	81.71	80.72	99%
සංස්කෘතික මධ්‍යස්ථානසඳහා බෙර/සංගීත උපකරණ / ගෘහ භාණ්ඩ අළුත්වැඩියාව, හා පුස්තකාල ප්‍රවර්ධනය සඳහා පොත් මිල දී ගැනීම 123-02-05-0-2002	1.00	0.37	37%
සංස්කෘතික මධ්‍යස්ථාන වෙත ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ ලබාදීම 123-02-05-0-2102	4.00	3.52	88%
සංස්කෘතික මධ්‍යස්ථාන වෙත යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ ලබාදීම 123-02-05-0-2103	3.00	2.94	98%
සංස්කෘතික මධ්‍යස්ථාන සුළු අළුත්වැඩියා, වැඩිදියුණු කිරීම් හා නඩත්තු කටයුතු 123-02-05-0-2001	5.00	4.38	88%
සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම (අතැති බිල් පියවීම) 123-02-05-23-2104	119.70	118.20 (අතැති බිල්ද සමග)	99%
කාර්ය මණ්ඩල පුහුණු 123-02-05-23-2401	1.00	0.17	17%

II. සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම - භෞතික ප්‍රගතිය 2019.12.31 දිනට

ප්‍රාදේශීයව ක්‍රියාත්මක මුළු සංස්කෘතික මධ්‍යස්ථාන ගණන	- 195
සම්පත්දායක පිරිස	- 1,667
සංස්කෘතික මධ්‍යස්ථානවලින් පුහුණු පහසුකම් ලබන සිසුන් ගණන	- 48,119
සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාල පහසුකම් ලබන පාඨක සංඛ්‍යාව	- 54,515
ප්‍රාදේශීයව සංස්කෘතික මධ්‍යස්ථාන මගින් පවත්වන ලද මුළු වැඩසටහන් ගණන	- 1,778

III. සංස්කෘතික මධ්‍යස්ථාන මගින් ලබාදෙන මූලික සේවාවන් - 2019

1. සෞන්දර්යය විෂයන් ප්‍රධාන කරගත් පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම
   - උඩරට, පහතරට, සබරගමු, භරත සහ ජන නැටුම්
   - පෙරදිග සහ අපරදිග සංගීතය
   - නාට්‍ය හා රංග කලාව
   - චිත්‍ර, මූර්ති සහ කැටයම් කලාව
   - කායික හා මානසික වර්ධනය
   - අත්කම් නිපැයුම්
   - සිංහල, දෙමළ, ඉංග්‍රීසි, පාලි හා සංස්කෘත භාෂාවන්

2. පුස්තකාල සේවාව
ප්‍රාදේශීය ජනතාවට පුස්තකාල පහසුකම් සැපයීමේ අරමුණින් ක්‍රියාත්මක අතර පසුගිය වසරේ ප්‍රකාශයට පත් වැදගත් සාහිත්‍ය කෘති අතුරින් කමිටුවක් මගින් තෝරා ගනු ලබන (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්)පොත් කට්ටලයක් වාර්ෂිකව දිවයින පුරා පිහිටි සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාල සඳහා බෙදා දෙනු ලැබේ.

3. සංස්කෘතික සේවාවන් සැපයීම
ප්‍රාදේශීය ජනතාවගේ අවශ්‍යතාවය මත ආගමික/ සංස්කෘතික උත්සව අවස්ථා සඳහා ප්‍රදේශයේ සංස්කෘතික මධ්‍යස්ථාන මගින් සංස්කෘතික සේවාවන් සැපයීම සිදු කරයි. මේ යටතේ ජය මංගල ගාථා කණ්ඩායම්, හේවිසි කණ්ඩායම්, මඟුල් බෙර කණ්ඩායම්, වෙස් නැටුම් කණ්ඩායම්, නර්තන කණ්ඩායම්, වීදි නාට්‍ය කණ්ඩායම් හා ගිහි පිරිත් කණ්ඩායම් ආදිය සපයනු ලබයි.

4. ආගමික/සංස්කෘතික/අධ්‍යාපනික හා සමාජ සුභ සාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රාදේශීය වශයෙන් වසර පුරා විවිධ ආගමික/සංස්කෘතික/අධ්‍යාපනික වැඩසටහන් තම සංවර්ධන අරමුදලින්/ ප්‍රදේශයේ මූල්‍ය දායකත්වයෙන්/ රජයේ දායකත්වයෙන් ප්‍රාදේශීය ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබයි. 2019 වසරේ සංස්කෘතික මධ්‍යස්ථාන මගින් ප්‍රාදේශීයව පවත්වන ලද මුළු වැඩසටහන් ගණන 1,778 කි..

5. සංස්කෘතික මධ්‍යස්ථාන ජාතික නර්තන සංචිතය
සංස්කෘතික මධ්‍යස්ථානවල සෞන්දර්යය පාඨමාලා හදාරන සිසුන් අතුරින් ප්‍රතිභාපූර්ණ සිසු සිසුවියන් ගෙන් සමන්විත නර්තන සංචිතයක් පවත්වාගෙන යනු ලබයි. රාජ්‍ය/ජාතික උත්සව සඳහාත් විදේශීය සංස්කෘතික සංචාර සඳහාත් මෙම නර්තන සංචිය දායකත්වය සපයනු ලබයි. 2019 වසරේ නර්තන සංචිතය ශිල්පීන් 70 කින් සමන්විත අතර රාජ්‍ය/ජාතික උත්සව 10 ක් සඳහාත් විදේශ සංචාර 03 ක් සඳහාත් දායකත්වය ලබා දී ඇත.

IV. සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් - භෞතික ප්‍රගතිය 2019.12.31 දිනට

- ඉදිකිරීම් අවසන් කර විවෘත කිරීමට නියමිත නව සංස්කෘතික මධ්‍යස්ථාන ගණන - 22
- ඉදිකරමින් පවතින නව සංස්කෘතික මධ්‍යස්ථාන ගණන - 12
- සුළු අළුත්වැඩියා,වැඩිදියුණු කිරීම් හා නඩත්තු සිදුකල සංස්කෘතික මධ්‍යස්ථාන ගණන - 33

V. ක්‍රියාත්මක කරන ලද අනිකුත් විශේෂිත සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් 2019 (පුනරාවර්තන)

	වැඩසටහන	ප්‍රතිපාදන 2019 රු.මි.	වියදම 2019.12.31 ට රු.මි.	මූල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය
1.	දඹාන ජන උරුම කේන්ද්‍රය නඩත්තු කිරීම. 123-2-5-2-1409	2.00	1.48	74%	දඹාන ජන උරුම කේන්ද්‍රයේ නඩත්තු කටයුතු සඳහා වාර්ෂිකව ප්‍රතිපාදන ලබා දේ.
2.	ජාතික සාහිත්‍යය කලා උත්සවය . 123-2-5-5-1409	15.049	14.84	99%	මෙවර ජාතික සාහිත්‍ය කලා මහෝත්සවය බදුල්ල - හාලිඇල ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගන හා ජාතික පාසල් පරිශ්‍රයේ දී 2019.09.27,28 හා 29 යන දිනයන්හි දී උත්කර්ෂවත් අයුරින් පවත්වන ලදී. ප්‍රදර්ශන කුටි, අලෙවි කුටි, නර්තන ප්‍රසංග හා වැඩමුළු, ජනවර්ග ගම්මාන නිර්මාණය, ඌව පළාත් නර්ථන

					තරඟ,දේශ නේතෘ සම්මාන ප්‍රදානය, දිස්ත්‍රික් කලාකරු සම්මාන ප්‍රදානය හා සාහිත්‍ය දේශන ආදී ප්‍රධාන උත්සව අංග රාශියකින් සමන්විත විය.
3.	සමාජ සංස්කෘතික ඒකාබද්ධතාවය සඳහා විශේෂ වැඩසටහන් 123-2-5-6-1508	10.97	10.81	99%	අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් විශේෂ ජාතික වැඩසටහන් සඳහා නර්තන අංග ලබා දීම හා සංස්කෘතික මධ්‍යස්ථාන විසින් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම වැඩසටහන මගින් පහසුකම් සපයනු ලැබේ.
4.	රාජ්‍ය ආයතනවල සංස්කෘතික කටයුතු නංවාලීම. 123-2-5-8-1409	2.5	2.361	95%	රාජ්‍ය හා රාජ්‍යානුබද්ධ ආයතනවල සේවක ප්‍රජාවේ නිර්මාණ කුසලතා ඇගයීම හා එළිදැක්වීම තුළින් එම නිලධාරීන් තවදුරටත් සාහිත්‍ය හා කලා කටයුතුවල නිරත කරවීමේ අපේක්ෂාවෙන් වාර්ෂිකව අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය පවත්වනු ලැබේ. අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය සඳහා සිංහල මාධ්‍යයෙන් නිර්මාණ 923 ක් ද දෙමළ මාධ්‍යයෙන් නිර්මාණ 332 ක් ද ඉදිරිපත් විය.
5.	විදේශ සංස්කෘතික සබඳතා වැඩසටහන 123-2-5-27-1409	14.74	13.96	95%	2019 වසර අවසන් වන විට ශ්‍රී ලංකාව විදේශ රටවල් 46 ක් සමග සංස්කෘතික සහයෝගිතා ගිවිසුම්වලට එළඹ ඇත. 2019 වසරේ ක්‍රියාත්මක කරන ලද සංස්කෘතික සබඳතා වැඩසටහන් ගණන 26 කි.

VI. ක්‍රියාත්මක කරන ලද අනිකුත් විශේෂිත සංස්කෘතික ප්‍රවර්ධන ව්‍යාපෘති/වැඩසටහන් 2019 (ප්‍රාග්ධන)

	වැඩසටහන	ප්‍රතිපාදන 2019 රු.මි.	වියදම 2019.12.31 ට රු.මි.	මූල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය
1.	සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම ඇස්තමේනතුගත මුදල රු.මි.1,583.60	107.30	47.69	44%	ව්‍යාපෘතියේ සමුච්චිත ඉදිකිරීම් ප්‍රගතිය 72%ක් හා සමුච්චිත වියදම රු.මි. 1,432.2ක් වන අතර 2019 ප්‍රතිපාදන 2018 ටෙන්ඩර් සඳහා වන" බැඳීම්(රු.මි.190) පියවීම සඳහා යොදා ඇත. ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳ සාකච්ඡා මට්ටමේ පවතී.
2.	ශිල්ප ගම්මාන වැඩසටහන	2.00	1.15	57%	වරකාපොල, කටුවන, තිහගොඩ හා තෙලිප්පලෙයි ශිල්ප ගම්මාන සඳහා යටිතල පහසුකම් හා උපකරණ ලබා දී ඇත.
3.	සංස්කෘතික වටිනාකම් හා දේශීය දැනුම පිළිබඳ පර්යේෂණ ක්‍රියාකාරකම්	1.00	0.24	24%	සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන ප්‍රති සංවිධානය කිරීම පිළිබඳ වැඩමුළුවත් බලංගොඩ පුහුණු මධ්‍යස්ථානයේ දී පවත්වා ඇත.

4.	ජාතික උරුමයන් සංරක්ෂණය හා ප්‍රවර්ධන වැඩසටහන්	8.00	7.94	99%	ජාතික සංස්කෘතික මධ්‍යස්ථාන නර්තන සංචිතයේ ශිල්පීන් (70) සඳහා පුහුණු වැඩමුළු 02 ක් පවත්වා ඇති අතර 2019 වසරේ එම ශිල්පීන් සම්බන්ධ වූ රාජ්‍ය/ජාතික උත්සව 10 ක් වන අතර විදේශ සංචාර03 කි.

VII. අමාත්‍යාංශ යටතේ ප්‍රතිපාදන ලබන ව්‍යවස්ථාපිත ආයතන

	ආයතනය	ප්‍රාග්ධන ප්‍රතිපාදන 2019 රු.මි.	වියදම 2019.12.31 ට රු.මි.	මූල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය
1.	ජාතික චිත්‍රපටි සංස්ථාව	45.00	16.10 (අතැති බිල්)	36%	100% • බී.ඒ.ඩබ්ලිව්. ජයමාන්න මැදිරිය නවීකරණය • සිනමා පුස්තකාලය හා කෞතුකාගාරය ඉදිකිරීම • පශ්චාත් නිෂ්පාදන කටයුතු ඉතිරි බිල්පත් ඉදිරිපත් විය යුතුව ඇත.
2.	ගාලුඋරුමය පදනම	36.00	12.63	35%	ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති ගණන 10 ක් වන අතර සමස්ථ භෞතික ප්‍රගතිය 98%කි.
3.	ටවර්හෝල් රඟහල පදනම	15.00	10.79	72%	• එල්ෆින්ස්ටන් රඟහල සඳහා ලී බඩු උපකරණ ලබා ගැනීම හා ජල සැපයුමට අවශ්‍ය වතුර ටැංකි මිල දී ගැනීම • සරසවිපාය අළුත්වැඩියා කටයුතු • වාහන අළුත්වැඩියා කටයුතු • වායුසමීකරණ යන්ත්‍රයක් හා පරිගණක 08 ක් මිල දී ගැනීම
4.	ජන කලා කේන්ද්‍රය	2.60	2.22	85%	පාඨමාලා හා කාර්යාල කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ ලබා ගැනීම
5.	රඟහළ පාලක මණ්ඩලය	29.60	12.08	41%	නව සිනමා ශාලාවේ ඉදිකිරීම් 95%ක් අවසන් කර ඇත.
6.	ශ්‍රී ලංකා කලා මණ්ඩලය	10	6.20	62%	සරසවි ප්‍රතිභා 2019 සංස්කෘතික පුනරුද වැඩසටහන් පැවැත්වීම නාට්‍ය කීර්ති සම්මානය සඳහා අනුග්‍රාහකත්වය ලබාදීම

2.2 විශේෂ ජයග්‍රහණ

- **ථෙරවාදී පාලි ත්‍රිපිටකය ජාතික උරුමයක් බවට පත් කිරීම හා ලෝක උරුමයක් බවට පත් කිරීම සඳහා වූ නිල අභිලාශය ඉදිරිපත් කිරීම.**
  2019 පෙබරවාරි මස 07 වන දින අංක 2109/13 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ථෙරවාදී පාලි ත්‍රිපිටකය ජාතික උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. තවද 2019 මාර්තු 23 දින මහනුවර දළදා මාළිගා පරිශ්‍රයේ දී පැවති "ත්‍රිපිටකාභිවන්දනා" විශේෂ වැඩසටහනේදී ථෙරවාදී පාලි ත්‍රිපිටකය ජාතික උරුමයක් බවට පත් කිරීම සඳහා වූ නිල අභිලාශය ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිත හැනා සිංගර් මහත්මිය වෙත භාර දෙන ලදී.

- ආදිවාසී ජීවනෝපාය ප්‍රවර්ධන වැඩසටහනක් ආරම්භ කිරීම
- ටවර් හෝල් රඟහල පදනම මගින් "සාරස" වෙබ් රේඩියෝව ආරම්භ කිරීම
- ජනකලා කේන්ද්‍රයේ පවත්වනු ලබන ලලිත කලා පාඨමාලාවන් TEVC (වෘත්තීය පුහුණු) ආයතනය හා එක්ව NVQ 4, 5, 6 තත්ත්වය දක්වා වර්ධනය කරගැනීම.

2.3 අභියෝග හා ඉදිරි ඉලක්ක

සංස්කෘතික හා ජාතික උරුම ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘතිය/ වැඩසටහන	ආරම්භ කළ/ යෝජිත දිනය	අපේක්ෂිත ප්‍රතිලාභ		ප්‍රතිලාභ ලැබෙන කාල වකවානුව
		ප්‍රමාණාත්මක	ගුණාත්මක	
සංස්කෘතික නවෝදය වැඩසටහන් මාලාව	ජනවාරි - දෙසැම්බර්	ප්‍රාදේශීයව පිහිටි සංස්කෘතික මධ්‍යස්ථාන 194 කසිසු සිසුවියන් හා ලක්ෂයක පම ප්‍රදේශවාසීන්	සංස්කෘතික මධ්‍යස්ථාන සිසුවියන්හට /ක සිසු194 යන් අරභයා විවිධ ක්ෂේත්‍ර ලැබෙන පුළුල් දැනුම	ජනවාරි - දෙසැම්බර්
ලෝක කාන්තා දිනය තේමා කර ගත් විශේෂ වැඩසටහන - 'සෙනෙහස - බස්නාහිර පළාත	මාර්තු	ගර්භණී මාතාවන් හා ඔවුන්ගේ පවුල් 1000 ක් පමණ	පෝෂ්‍යදායී සහ ගුණාත්මකභාවයෙන් යුතු දරු පරපුරක් බිහිකර ගැනීම පිළිබඳ ව ගර්භනී මාතාවන්ට ලැබෙන දැනුම සහ අවබෝධය	මාර්තු
බක්මහ උළෙල - 'බක්මහේ කොවුල් හඬ වැඩසටහන ම මධ්‍ය - පළාත	අප්‍රේල්	ප්‍රදේශවාසීන් 5000 ක් පමණ	ජාතීන් අතර සාමයසමගිය , ඩා පිළිබඳ ජන ක්‍රී ඇතිවීම සහ ව වර්තමාන පරම්පරාවට ලැබෙන දැනුම	අප්‍රේල්
අන්තර් රාජ්‍ය සේවා නිර්මාණ තරගාවලිය හා 2019හි සම්මාන ප්‍රදානෝත්සවය	සැප්තැම්බර්	කලා කුසලතා ඇති නිර්මාණ කාර්යයෙහි නිරත රජයේ සේවකයන් 5000 ක් පමණ	රාජ්‍ය අංශයේ සේවයේ නිරතවන්නන් අතර කලා කුසලතාවය වැඩි දියුණු කර සංවේදී සහ ජනතා හිතවාදී රාජ්‍ය සේවයක් ඇති කිරීම පිළිබඳ ව ලැබෙන දැනුම සහ අවබෝධය	සැප්තැම්බර්
තෝරාගත් ශිල්ප කලා ගම්මානවල යටිතළ පහසුකම් වැඩිදියුණු කිරීම	ජනවාරි - දෙසැම්බර්	පාරම්පරික ශිල්පීන් 200 ක් පමණ	අභාවයට යමින් පවතින ශිල්ප කලා රැක ගැනීම සහ එම ක්ෂේත්‍රයන් හි නිරතවන ශිල්පීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම	ජනවාරි - දෙසැම්බර්
සංස්කෘතික මධ්‍යස්ථානවල පාඨමාලාවල තත්වය ඉහළ නැංවීම අරමුණු කරගත් පර්යේෂණය	ජනවාරි - දෙසැම්බර්	සංස්කෘතික මධ්‍යස්ථානවල අධ්‍යාපනය ලබන සිසුන් 10000 ක් පමණ	අදාළ ප්‍රදේශයන්හි අභාවයට යමින් පවතින සංස්කෘතික අංග පිළිබඳ ළමා පරපුර දැනුවත් වීම සහ දේශයට හිතැති ධනාත්මක චින්තනයෙන් යුතු අනාගත පරපුරක් බිහිවීම	ජනවාරි - දෙසැම්බර්

ව්‍යාපෘතිය/ වැඩසටහන	ආරම්භ කළ/ යෝජිත දිනය	අපේක්ෂිත ප්‍රතිලාභ		ප්‍රතිලාභ ලැබෙන කාල වකවානුව
		ප්‍රමාණාත්මක	ගුණාත්මක	
ප්‍රතිභා අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන තරගාවලියෙහි සම්මාන ප්‍රදානෝත්සවය	නොවැම්බර්	සංස්කෘතික මධ්‍යස්ථානවල අධ්‍යාපනය ලබන සිසුන් 10000 ක් පමණ	සංස්කෘතික මධ්‍යස්ථානවල ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යයාවන් ක පමණ 50000 පිරිසකගේ කලා රසඥතාවය සහ කුසලතාවය වර්ධනය වීම	නොවැම්බර්
ලෝක සංස්කෘතික දිනය තේමා කර ගත් විශේෂ වැඩසටහන - ඌව පළාත මූලික කර .ගනිමින් පැවැත් වේ	මැයි	විවිධ සංස්කෘතීන්ට අයත් ජනතාව 2000 ක් පමණ	ආදිවාසී ජනතාවගේ පාරම්පරික ඇදහිලි විශ්වාස පිළිබඳ ව ලැබෙන දැනුම	මැයි
උතුර දකුණ - සංස්කෘතික හුවමාරු - වැඩසටහන'නැගම් යාම' - උතුරු පළාත මූලික කර ගනිමින් පැවැත් වේ.	ජූනි	උතුරු හා දකුණු පළාත්වල අධ්‍යාපනය ලබන වයසේ පසුවන දරු දැරියන් 1000 ක් පමණ	ජාතීන් අතර සාමය , සහජීවනය සහ සහයෝගය වැඩිදියුණු වීම	ජූනි
පාරම්පරික දේශීය කලාංග හා සම්ප්‍රදායයන් සුරැකීම හා සංරක්ෂණය සඳහා වූ විශේෂ වැඩසටහන- සබරගමුව පළාත මූලික කර ගනිමින් පැවැත් වේ.	ජූලි	පාරම්පරික කලා ශිල්පීන් 500 ක් පමණ	පාරම්පරික කලාකරුවන් ඇගයීම හා දිරිගැන්වීම	ජූලි
ජාතික සාහිත්‍යය කලා මහෝත්සවය	අගෝස්තු	සමස්ත ජනතාව , , කලාකරුවන පාරම්පරික ප්‍රදේශවාසීන් ශිල්පීන්	දේශීය සාහිත්‍යය කලාව සහ සංස්කෘතිය පිළිබඳ ව බාල පරපුර දැනුවත් වීම සහ රසඥතාවයෙන් යුතු සිසු පිරිසක් බිහිවීම මෙන් ම පාරම්පරික කලාකරුවන් දිරිගැන්වීම සහ ඇගයීම	අගෝස්තු
'සංස්කෘතික කඳවුර' - විවිධ සංස්කෘතීන් බෙදාහදා ගැනීමේ හා ඇගැයීමේ අධ්‍යාපනික කඳවුර -නැගෙනහිර පළාත මූලික කර ගනිමින් පැවැත් වේ.	සැප්තැම්බර්	විවිධ සංස්කෘතික පසුබිම්වලට අයත් සිසුදරුදැරියන් 1000 ක් පමණ	ජාතීන් අතර සාමය , සහයෝගය සහජීවනය සහ වැඩිදියුණු වීම	සැප්තැම්බර්
ලෝක ළමා හා වැඩිහිටි දිනය තේමා කර ගත් විශේෂ වැඩසටහනවයඔ .- පළාත මූලික කර ගනිමින් පැවැත් වේ.	ඔක්තෝබර්	ළමුන් හා වැඩිහිටියන් 500 ක් පමණ	සුරක්ෂිත ළමා පරපුරක් බිහිවීම මෙන් ම වැඩිහිටියන්ට සැළකීමේ ගුණාංගය වැඩිදියුණු වීම සහ ළමුන් සහ වැඩිහිටියන්ගේ සුභසාධනය සහ ආරක්ෂාව	ඔක්තෝබර්

ව්‍යාපෘතිය/ වැඩසටහන	ආරම්භ කළ/ යෝජිත දිනය	අපේක්ෂිත ප්‍රතිලාභ		ප්‍රතිලාභ ලැබෙන කාල වකවානුව
		ප්‍රමාණාත්මක	ගුණාත්මක	
'කෙතක වරුණ'- උතුරු මැද පළාත මූලික කර ගනිමින් පැවැත්වේ	නොවැම්බර්	ප්‍රදේශවාසී ගොවි ජනතාව 200 ක් පමණ	පාරම්පරික කෘෂිකාර්මික ක්‍රම පිළිබඳ ව ජනතාව දැනුවත් වීම සහ වසවිසෙන් තොර ආහාර වගා කිරීමේ ඇති වැදගත්කම පිළිබඳ ව ලැබෙන අවබෝධය	නොවැම්බර්
විදේශීය සංචාරකයින් සම්බන්ධ කරගනිමින් සිදු කරනු ලබන සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන - දකුණු පළාත මූලික කර ගනිමින් පැවැත් .වේ	දෙසැම්බර්	විදේශ සංචාරකයින් , සංචාරක මහ ,පෙන්වන්නන් ප්‍රදේශවාසීන් 5000 ක් පමණ	දේශීය කලාව සහ සංස්කෘතික අංග පිළිබඳ ව විදේශීය සංචාරකයන් අතර දැනුවත්භාවයක් ඇති කිරීම තුළින් දේශීය කලාකරුවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම	දෙසැම්බර්
වැඩ අවසන් කළ සංස්කෘතික මධ්‍යස්ථාන විවෘත කිරීම	ජනවාරි සිට අප්‍රේල් දක්වා	මධ්‍යස්ථාන 22ක්	දේශීය කලා අංග ප්‍රවර්ධනය හා සංරක්ෂණය	දීර්ඝ කාලීන
ඉදිකරමින් පවතින සංස්කෘතික මධ්‍යස්ථානවල වැඩ අවසන් කිරීම	ජනවාරි සිට දෙසැම්බර් දක්වා	මධ්‍යස්ථාන 12ක්	-එම-	දීර්ඝ කාලීන
දැයේ උරුමය දරුවන්ටයි දැනුවත් කිරීමේ වැඩසටහන	2020.02.15	වැඩසටහන් 16ක්	ජාතික උරුමයන් පිළිබඳ දැනුමින් සහ ආකල්පවලින් හෙබි පාසල් දරු දැරියන් 3000ක් සහ ගුරු සිසු සිසුවියන් 1000ක් පුරාවිද්‍යා නීතිය සම්බන්ධයෙන් මනා දැනුමකින් යුතු පොලිස් නිලධාරීන් 250 ක්	2020.02.15-2020.04.30
ආදිවාසී ජන උරුම සංරක්ෂණ වැඩසටහන	2020.02.01	01	යටත්විජිත සමයේ දී පර්යේෂණ කටයුතු සඳහා මෙරටින් රැගෙනගිය ආදිවාසීන්ට අයත් අස්ථි කොටස් මහජන ප්‍රදර්ශනය සඳහා තැබීමේ ප්‍රදර්ශන මැදිරියක් දඹාන ජන උරුම කෞතුකාරය තුළ ස්ථාපිත කිරීම	2020.02.01-2020.04.30

.....

ප්‍රධාන ගණන් දීමේ නිලධාරී

එම්. කේ. බන්දුල හරිස්චන්ද්‍ර
ලේකම්
බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික
කටයුතු අමාත්‍යාංශය
08 වන මහල, "සෙත්සිරිපාය"
බත්තරමුල්ල

නම - එම්.කේ. බන්දුල හරිස්චන්ද්‍ර

තනතුර - ලේකම්, බුද්ධ ශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය

දිනය - 2020 - 02 - 27

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ-එෆ්

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2019		සටහන	තත්‍ය 2019	2018	
	ආදායම් ලැබීම්				
	ආදායම් බදු	1			ඒසිඒ-1
	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2			
	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3			
	බදු නොවන ආදායම් හා වෙනත්	4			
	මුළු ආදායම් ලැබීම් (අ)		-		
	ආදායම් නොවන ලැබීම්				
	භාණ්ඩාගාර අග්‍රිම		957,388,000.00	1,435,035,000.00	ඒසිඒ-3
	තැන්පතු		8,650,191.10	19,039,759.15	ඒසිඒ-4
	අත්තිකාරම් ගිණුම්		42,892,146.53	36,062,433.02	ඒසිඒ-5/5(ඒ)
	වෙනත් ලැබීම්		21,374,036.30	13,396,423.15	
	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**1,030,304,373.93**	**1,503,533,615.32**	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**1,030,304,373.93**	**1,503,533,615.32**	
	අඩුකළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
502,000,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	494,137,405.97	514,314,130.91	
273,925,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	252,232,998.41	164,525,495.67	ඒසිඒ-2(ii)
280,325,000.00	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	232,032,173.23	156,335,251.68	
	පොළී ගෙවීම්	8	-	-	
	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
1,056,250,000.00	මුළු පුනරාවර්තන වියදම් (ඇ)		**978,402,577.61**	**835,174,878.26**	
	මූලධන වියදම්				
27,750,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	19,875,822.19	44,639,017.22	
250,200,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	149,297,296.22	410,023,513.66	
96,000,000.00	ප්‍රාග්ධන මාරුකිරීම්	12	23,423,084.21	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
3,200,000.00	හැකියා වර්ධනය	14	1,853,218.91	3,496,847.50	

21,000,000.00	වෙනත් මූලධන වියදම්	15	14,567,380.50	1,014,764,317.15	
398,150,000.00	**මුළු මූලධන වියදම් (ඉ)**		**209,016,802.03**	**1,472,923,695.53**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**80,732,882.82**	**53,452,997.78**	
	තැන්පතු ගෙවීම්		31,079,590.93	15,824,867.52	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		49,653,291.89	37,628,130.26	ඒසිඒ-5/5(ඒ)/5(බී)
1,454,400,000.00	**මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)**		**1,268,152,262.46**	**2,361,551,571.57**	
(1,454,400,000.00)	2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)		**(237,847,888.53)**	**(858,017,956.25)**	

2019 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහ	තක්‍ය 2019 රු.	2018 රු.
මූල්‍ය නොවන වත්තකම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	3,244,379,353.89	3,152,176,151.33
මූල්‍ය වත්තකම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	106,828,290.09	100,067,144.73
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3/සටහන 1	-	2,174,074.51
මුළු වත්තකම්		**3,351,207,643.98**	**3,254,417,370.57**
ශුද්ධ වත්තකම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		59,588,252.27	32,571,781.59
දේපළ පිරියත හා උපකරණ සංචිතය		3,244,379,353.89	3,152,176,151.33
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	47,240,037.82	69,669,437.65
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**3,351,207,643.98**	**3,254,417,370.57**

පිටු අංක 01 සිට 57 දැක්වෙන ඉහත ඒසිඒ 1 සිට ඒසිඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 58 සිට 91 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමග එකග වන බවටත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/අධ්‍යක්ෂ (මුදල්) / කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	තනතුර :
දිනය : 2020/02/27	දිනය :	දිනය : 20/02/27
එම්. කේ. බන්දුල හරිස්චන්ද්‍ර ලේකම් බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය 08 වන මහල, "සෙත්සිරිපාය" බත්තරමුල්ල		ගීතා හේමන්ති රූබසිංහ ප්‍රධාන ගණකාධිකාරි බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය 8 වන මහල, "සෙත්සිරිපාය" බත්තරමුල්ල.

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්ෂ	2019 රු.	2018 රු.
